**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**වෛද්‍ය කර්මය සඳහා වූ අතුරු වෛද්‍ය සේවාවේ පුහුණු පාඨමාලා සඳහා**

**සිසුන් බඳවා ගැනීම - 2026**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලා සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2026.08.07 දින සිට 2026.08.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කල හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

**1. සැලකිය යුතුයි:**

1.1. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත්කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2019 සිට 2020,2021,2022 හා 2023 දක්වා වර්ෂ වලින් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයෙකුට වුවද ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කල හැකිය. එසේ නොමැතිව වර්ෂ කිහිපයෙන්ම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.2. පසුගිය වසර කිහිපයක් තුළ බඳවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී එක් සිසුවෙකු විසින් රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ විවිධ රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක ලියාපදිංචිම නිසා, සුදුසුකම් සහිත සිසුන් ගණනාවකට එවැනි එක් අවස්ථාවක් හෝ නොලැබීයාමේ තත්වයක් නිරීක්ෂණය විය. ඊට අමතරව මෙම තත්වය නිසා රජයේ මුදල් අපතේ යාමක් සිදුවන අතරම පාඨමාලාව අවසානයේදී අපේක්ෂා කල පුහුණු වෘත්තිකයින් සංඛ්‍යාව නොමැතිවීම නිසා අදාල ආයතන වල සැළසුම්ගත ඉලක්කයන් ද ඉටුකරගත නොහැකි වේ. එබැවින්, මෙම තත්වය අවම කර සෑම අයදුම්කරුවෙකුටම එක් අවස්ථාවක් හෝ හිමිකර දීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම ගැසට් නිවේදනයෙහි අංක 6 ඡේදය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව අංක 6.1 සිට 6.5 දක්වා වන අනුඡේද වලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි නුසුදුසු අයෙකු මේ සඳහා අයදුම් නොකළ යුතුය. කෙසේ වෙතත්, එවැනි නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඔවුන්ට විරුද්ධව ගැසට් නිවේදනයේ 7.3 අනුඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

1.3. පසුගිය බඳවාගැනීම් වලදී සාවද්‍ය තොරතුරු (සාවද්‍ය විභාග වර්ෂ, විෂයන්, ලබා ඇති ශ්‍රේණි යනාදිය) ඇතුළත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාජ තොරතුරු ඇතුළත් කර සකස් කරන ලද සහතික සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය විය. එය බරපතල වරදකි. එබැවින්, කිසිඳු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුළත් නොකල යුතුය. සාවද්‍ය තොරතුරු ඇතුලත් කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක්ම කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

1.4. සෑම අයදුම්කරුවෙකු විසින්ම පළමුව මෙම ගැසට් නිවේදනයේ සහ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතුය. අනතුරුව ගැසට් නිවේදනයේ 8.4 ඡේදයට අනුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු. 1000/- ක මුදල ගෙවා ලබාගත් රිසිට් පත, ද 10.4, 10.5, හා 10.6 යන ඡේදවල දක්වා ඇති ලේඛණ ද සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකල හැකිවේ.

02 .බඳවා ගැනීමට අදාළ පුහුණු පාඨමාලා සහ පුහුණු කාලසීමාව

අංක 01 වගුව

| සංඛ්‍යා අංකය | සේවාව | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාලසීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|
| 1. | අතුරු වෛද්‍ය සේවාව | දන්ත කාර්මික ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 2. | | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 02 | ඉංග්‍රීසි |
| 3. | | අංගාදේශක හා සෘජුකරණඥ | වසර 03 | ඉංග්‍රීසි |
| 4. | | සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරී | වසර 02 | ඉංග්‍රීසි |
| 5. | | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 6. | | ඛන්තු රේඛන ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 7. | | ඖෂධ සංයෝජක | වසර 01 | ඉංග්‍රීසි |
| 8. | | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | වසර 02 | ඉංග්‍රීසි |

03. තනතුරට අදාල අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

අංක 02 වගුව

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | දන්ත කාර්මික ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පරණි නිර්දේශය) හෝ(නව නිර්දේශය) 2021 වර්ෂයේ 2022 වර්ෂයේ හා 2023 යන වර්ෂ වල විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් <u>**රසායන විද්‍යාව**</u> විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කල හැකිය |
| 02 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 (පැරණි නිර්දේශය)හෝ2020(නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ හෝ 2023 වර්ෂ යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් <u>**ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය**</u> විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි.<br><br>උස අඩි 5 යි අඟල් 2 ක් හෝ ඊට වැඩි විය යුතුය. (157.46cm) |
| 03 | අංගාදේශක හා සෘජුකරණඥ | දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව, ගණිතය, **ඉංග්‍රීසි** සහ **සිංහල / දෙමළ** යන **විෂයන්ට** සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ(පැරණි නිර්දේශය) 2020 වර්ෂයේ (නව නිර්දේශය) 2021 හෝ 2022 හා 2023වර්ෂයේ යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් <u>**භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව**</u> විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කල හැකිය |
| 04 | සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරී | සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 හෝ 2022 2023 වර්ෂයේ යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් <u>**ජීව විද්‍යාව**</u> විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>අයදුම් කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |

| | | | | |
|---|---|---|---|---|
| 05 | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හා 2021,2022 සහ 2023 යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br>අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>උස අඩි 4 යි අඟල් 10 ක් හෝ ඊට වැඩි විය යුතුය. (147.3 CM)<br><br>අයදුම්කාරියන් අවිවාහක විය යුතුය. |
| 06 | බන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය)2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හා 2021 හා 2022 සහ 2023 වර්ෂ වල යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයන් දෙක (02) සහිතව විෂයන් තුනම (03) එක් වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කල හැකිය. |
| 07 | ඖෂධ සංයෝජක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021.හෝ 2022 හෝ 2023 යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කල හැකිය |
| 08 | විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021.හෝ 2022 හෝ 2023 යන විභාග වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් දෙකක් (02) සහිතව විෂයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කල හැකිය |

**04. පාඨමාලාවලට තෝරාගැනීමේ ක්‍රමවේදය :**

4.1. අතුරු වෛද්‍ය සේවාවේ තනතුරුවලට බඳවා ගැනීමේ පරිපාටිවල හා ඊට වරින් වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන, සලකුණු කර ඇති පාඨමාලාවල ප්‍රමුඛතා අනුපිළිවෙල ද සැලකිල්ලට ගෙන එක් පුහුණු පාඨමාලාවකට පමණක් තෝරාගනු ලැබේ.

4.2. පුරෝකථනය කළ පුරප්පාඩු සංඛ්‍යාව, පුහුණු ධාරිතාවය, පුහුණු පාසල්වල පවතින පහසුකම්, තත්කාලීනව රටේ පවත්නා මූල්‍ය හා වෙනත් විශේෂිත තත්වයන් යනාදී කරුණු පිළිබඳව සැලකිල්ලට ගෙන පුහුණුව සඳහා බඳවාගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන අතර, දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් පළාතේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

4.3. ඉන්පසු එම එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාල පළාතෙන් එක් එක් විභාගයෙන් අයදුම්කර අවම සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ පළාතෙන් එක් එක් විභාගයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

4.4. අනතුරුව එම එක් එක් විභාගයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව එම විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් අයදුම්කර, අවම සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ පළාතෙන් එක් එක් විභාගයට අදාල එක් එක් විෂයධාරා යටතේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතරින් සළකුණු කර ඇති පාඨමාලා අනුපිළිවෙල ද සැලකිල්ලට ගෙන පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

4.5. යම් පළාතකට ඉහත සඳහන් පරිදි වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාව එම පළාත සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කල නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ අනෙකුත් පළාත් අතර එම පළාත්වල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

**සටහන :-**

(අ) සෑම අයදුම්කරුවෙකුම ඉහත 4.1. ඡේදය අනුව තේරී පත්වන පාඨමාලාවට ඇතුලත් විය යුතු අතර, ඔවුන්ට වෙනත් පාඨමාලාවකට ඇතුලත් වීමට හෝ මාරුවීමට හෝ අවස්ථාව ලබාදෙනු නොලැබේ.

(ආ) එසේම පාඨමාලාවක ලියාපදිංචි නොවන සිසුන් වෙනුවෙන් නැවත වරක් සිසුන් තෝරාගැනීම තුලින් ඔවුන් ඒ ඒ පාඨමාලා අතර, හුවමාරුවීමෙන් මතුවන අර්බුදකාරී තත්වය වැලැක්වීම සඳහා එක්වරක් පමණක් සිසුන් තෝරාගනු ලබන අතර, කිසිඳු පාඨමාලාවකට නැවත වරක් සිසුන් බඳවාගනු නොලැබේ.

(ඇ) අවසන් වරට නිකුත් කරන ලද (අංක 2200 හා 2020.10.29 ) ගැසට් නිවේදනයෙහි යෝග්‍ය තාව කොටසෙහි සඳහන් සංශෝධනය අනුව

* සෑම අපේක්ෂකයෙකුම ඕනෑම ප්‍රදේශයකම සේවාව ලබා දීම සඳහා බැඳීසිටිය යුතුය.

*පුහුණුවෙන් පසු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලදහොත් ඔබ අවම වශයෙන් වසර 10ක සේවාවක් කිරීමට කැමැති විය යුතුය.

**05. යෝග්‍යතාව :- සෑම අයදුම්කරුවෙකු ම -**

5.1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

5.2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යහපත් කායික සහ මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතුය.

5.3. තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකා බැලීම සඳහා අයදුම්කරු එම දිස්ත්‍රික්කය තුල අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2026.08.31** වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය. එය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් එලෙස අඛණ්ඩ වසර 03 ක පදිංචි කාලසීමාව සනාථකල නොහැකි අයදුම්කරුවන් සඳහා ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය ලෙස ඔවුන් විසින් අයදුම්කර ඇති දිස්ත්‍රික්කය ලබාදිය නොහැකි අතර, එවැනි අයදුම්කරුවන්ගේ පූර්ව පදිංචි කාලසීමාව පිළිබඳව සලකා බලා ඊළග අත්‍යාසන්න වැඩිම කාලසීමාවක් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අයදුම්කරුට හිමි දිස්ත්‍රික්කය ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ලේඛණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත **අයදුම්කරු විසින් නොපමාව ඉදිරිපත් කල යුතුය.**

සටහන :-

යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කල හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට පූර්වාසන්න වසර 03 තුල පදිංචිය සනාථ කල නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කලහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

**06. පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුලත් වීමට නුසුදුස්සන් :**

6.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක / රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා **"රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද"** යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

6.2. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

6.3. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අය.

6.4. ඉහත 6.1, 6.2 හා 6.3 යටතේ සඳහන් ආයතනයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් මෙම ගැසට් නිවේදනය පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගත්ත ද ඔවුන් මේ සඳහා අයදුම් කිරීමට / ඇතුලත් වීමට සුදුසුකම් නොලබති. තවද ගැසට් නිවේදනය පළවීමෙන් පසුව ද / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාල පාඨමාලාවක ලියාපදිංචි වී එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබති.

6.5. <u>**විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අය.(මෙම වගන්ති අවශ්‍ය වන්නේ පාසල් දන්ත චිකිත්සක පාඨමාලා පමණි.)**</u>

**07. වෙනත් කරුණු :**

7.1. ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) මෙම පාඨමාලාවට අයදුම්පත් කැඳවීමේ දිනට එනම් 2026.08.07 දිනට පෙර දිනයක් විය යුතුය.

7.2. ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණද අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව/පාඨමාලා සඳහා ඇතුලත් කර ගන්නේය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මඟින් අදහස් <u>නොකෙරෙන</u> බව තරයේ සිහි තබා ගත යුතුය. එමෙන්ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණද, සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිඳු අයුරකින් මෙම පාඨමාලා සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

7.3. ඉහත 6.1., 6.2. හා 6.3. යටතේ සඳහන් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින අයෙකු හෝ 6.4. හා 6.5. ඡේදවල දක්වා ඇති නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් අදාල පාඨමාලාවෙන් / තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමටද ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

7.4. සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල වලංගු දිනය අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වන 2026.08.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

7.5. තවද, යම් පාඨමාලාවකට ගැසට් නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් නොමැතිව අයදුම් කිරීමෙන් පසු, එමඟින් අයදුම්කරුට සිදුවන අපහසුතා පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් කිසිඳු වගකීමක් දරනු නොලැබේ.

**08. අයදුම් කල යුතු ක්‍රමය :**

8.1. ඉහත පුහුණු පාඨමාලා සඳහා අයදුම් කල යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කල යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අපගේ වෙබ් අඩවියෙහි මෙම ගැසට් නිවේදනය සමඟ ඉදිරිපත් කර ඇති උපදෙස් පත්‍රිකාව බලන්න.

8.2. අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

8.3. ඉහත පාඨමාලා සඳහා ඔබ විසින් මූලික සුදුසුකම් සපුරා ඇත්නම්, ඔබට එක් පාඨමාලාවකට හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ අයදුම් කළ හැකිය. එලෙස ඔබ පාඨමාලා දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම්, වෙබ් අඩවියේ දැක්වෙන අයදුම්පතෙහි ඔබගේ මනාපයට අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලට ඒ ඒ පාඨමාලා තෝරා ගත යුතුය. එලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත උඩුගත කිරීමෙන් පසු එහි ඔබගේ මනාපයට අනුව තෝරාගෙන සලකුණු කර ඇති පාඨමාලා අනුපිළිවෙල වෙනස් කිරීමට හෝ තෝරාගෙන ඇති පාඨමාලා අතරින් එකක් හෝ කිහිපයක් ඉවත් කර ගැනීමට හෝ නව පාඨමාලාවක් හෝ කිහිපයක් ඇතුළත් කිරීමට හෝ කිසිදු අවස්ථාවකදී කිසිඳු කරුණක් මත ඉඩ දෙනු නොලැබේ.

8.4. අයදුම්කරුවන් රු. 1000/- ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් **ශාඛාවේ අංක 7041318 දරණ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ විභාග ගාස්තු රැස්කිරීමේ ගිණුමට ගෙවිය යුතුය. සෑම අයදුම්කරුවෙකුම මෙම මුදල අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර** ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීමට කටයුතු කල යුතු අතර, ඒ සඳහා ලැබෙන රිසිට් පතෙහි මුද්‍රිත අංකය අයදුම්පතේ අදාල ස්ථානයට ඇතුලත් කිරීමෙන් පසුව පමණක් තම අයදුම්පත අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කල යුතුය. **මෙම ගෙවීම මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් සිදු නොකළ යුතුය.** මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. ඔබ විසින් උක්ත ගෙවීමට අදාල සාක්ෂි (රිසිට් පත) **සුරක්ෂිතව** තබාගත යුතු අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වුවහොත් **එය අනිවාර්යයෙන් ම** ඉදිරිපත් කල යුතුය. ඒ අනුව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් සිදුකර ඇති බවට නිරීක්ෂණය වන අයදුම්කරුවන් සහ රිසිට්පතක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මේ සඳහා බඳවාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**8.5.ඉදිරිපත් කරන ලද විද්‍යුත් අයදුම්පතෙහි පිටපත සහ අංක 05 කින් යුත් කේතය ලබාගැනීම.**

(අ). මෙම ගැසට් නිවේදනයේ සහ ඒ සමගම විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වෙබ් අඩවියෙහි පළකර ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණු වලට අනුව සාර්ථකව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුටම තම අයදුම්පත විධිමත් පරිදි යොමු වූ වහාම එහි පිටපතක් සහ තමාටම අනන්‍ය වූ අංක 05 කින් යුත් කේතයක් ලැබේ.

(ආ). සෑම අයදුම්කරුවෙකු විසින්ම එලෙස පරිඝණක තිරයේ දිස්වන තම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (Print-out) ලබාගත යුතුය. එය තැපැල් මගින් එවීමට අවශ්‍ය නොවේ. අයදුම්පතක් ඉදිරිපත් කළ සෑම අයදුම්කරුවෙකුටම තමා මේ සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ බව තහවුරු කිරීම සඳහා පවතින විධිමත් සහ එකම සාක්ෂිය මෙම පිටපත බැවින් එය සුරක්ෂිතව තබා ගැනීම ඔබ සතු වගකීමකි. ඊට අමතරව අංක 05 කින් යුත් කේතය ද සුරක්ෂිතව තබාගැනීමෙන් ඔබ විසින් ඉදිරිපත් කල අයදුම්පතේ පිටපත් පසුව ලබාගත හැකිය.

(ඇ). යම් අවස්ථාවක තම අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු එහි පිටපතක් හෝ අංක 05 කින් යුත් කේතයක් නොලැබෙන අයදුම්කරුවන් වේ නම්, ඔවුන්ගේ අයදුම්පත් නිසි පරිදි උඩුගත වී /ඉදිරිපත් වී නොමැති බව වටහා ගත යුතුය. එවැනි සියලු දෙනාම අයදුම්පත් ඉදිරිපත් නොකල සිසුන් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එවැනි අයදුම්කරුවෙකු කඩිනමින් පහත 8.6. (අ) ඡේදයේ දක්වා ඇති දුරකථනය හෝ / සහ විද්‍යුත් තැපැල හරහා **මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකය සමග** සම්බන්ධ වී තම අයදුම්පත පිළිබඳ ගැටලුව 2026.08.31 දිනට පෙර විසඳා ගෙන තමාට අයත් කේතය හා අයදුම්පතෙහි පිටපත ලබාගැනීමට කටයුතු කල යුතු අතර, මෙම කාර්යය සම්පූර්ණයෙන්ම අයදුම්කරු සතු වගකීමක් බවද අවධාරණය කරමි. කෙසේ වෙතත්, විධිමත් පරිදි මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැති විද්‍යුත් අයදුම්පත් සම්බන්ධයෙන් 2026.08.31 දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ද කිසිසේත් සලකා බලනු නොලැබේ.

(ඈ). තවද, අයදුම්කරුවෙකු විසින් මෙම බඳවාගැනීමට අදාල කිසියම් කරුණක් සම්බන්ධයෙන් කරනු ලබන සෑම ඉල්ලීමක් සමගම තම අයදුම්පතෙහි පිටපතක් එවිය යුතු අතර, එය නොමැතිව ඉදිරිපත් කරනු කිසිඳු ඉල්ලීමක් පිළිබඳව සලකා බලනු නොලබන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

**8.6. අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම්**

(අ). මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටලුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත 8.5 (ඇ). ඡේදයේ දැක්වෙන ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් **සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007 අමතන්න.** hrcodmoh@gmail.com **විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය.** **(විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ වන සැමවිටම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**

(ආ). අදාල සියළු තොරතුරු මෙම ගැසට් නිවේදනයෙ හි සහ සෞඛ්‍ය හා ජනමධ්‍ය අමාත්‍යාංශ https://www.health.gov.lk වෙබ් අඩවියෙ හි සවිස්තරව දක්වා ඇති බැවින්, වෙනත් කරුණු පිළිබඳව විමසීමෙන් වලකින්න.

**09. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :**

9.1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු /ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු / රජයේ විදුහල්පති වරයෙකු / සාමදාන විනිශ්චය කාරවරයෙකු / නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 854,880/- කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කල යුතුය.

9.2. මෙම ගැසට් නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකුල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**10. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කල යුතු තොරතුරු :**

10.1. ඔබ විසින් සාර්ථකව උඩුගත කර ඇති විද්‍යුත් අයදුම්පත අනුව **අවම අධ්‍යාපන සුදුසුකම්** සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඒ ඒ තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටිවල සහ මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.

නොවැළැක්විය හැකි හේතුවක් මත (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පිළිගතහැකි) කිසියම් අයදුම්කරුවෙකුට කිසියම් සහතිකයක් / ලේඛනයක් එදිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපදෙස් පරිදි එකී සහතික / ලේඛන සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට දින 07 ක් ඇතුළත මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ අංශය වෙත පැමිණ භාරදිය යුතු අතර, එසේ නොකරන සියලු අයදුම්කරුවන් මේ සඳහා තෝරාගැනීමට නුසුදුස්සන් සේ සළකා කටයුතු කරනු ලැබේ.

10.2. විද්‍යුත් මාධ්‍යයෙන් උඩුගත කරන ලද (upload) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (9.1 ඡේදයේ දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරන ලද)

10.3. උප්පැන්න සහතිකය

10.4. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල)

10.5. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය. (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල)

10.6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය

10.7. රු. 1000/- ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත

10.8. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය

10.9. ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන බී 59 පොදු ආකෘති පත්‍රය)

10.10. **ඉහත අංක 6.5 අනු ඡේදයෙහි දක්වා ඇති පරිදි විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50/- ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය. (මෙම වගන්තිය අවශ්‍ය පාසල් දන්ත චිකිත්සක වැනි අදාල තනතුරු තිබේ නම් පමණකි)**

10.11. ඉහත අංක 6 ඡේදයෙහි 6.1 සිට 6.4 දක්වා වූ අනු ඡේදවලින් විස්තර කර ඇති පරිදි නුසුදුසුකම් නොපවතින අයෙකු බව සනාථ කිරීම සඳහා වන බහුමාන සහතිකය.

සටහන:-

(අ) **ඉහත <u>10.2. සිට 10.11</u>** දක්වා වන ඡේදවල සඳහන් ලේඛනවල තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේ දී රැගෙන ආ යුතුය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිඳු වගන්තියකින් අදහස් නොකෙරේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http://www.health.gov.lk මෙම අමාත්‍යාංශයීය **වෙබ් අඩවියේ පලකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.** කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකථන අංක සහ/හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, ඒවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාල තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

(ඉ) ගැසට් නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් නියමිත පරිදි පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී නොවූවන් විසින් හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වී නියමිත දිනට ලියාපදිංචි නොවූ අයදුම්කරුවන් විසින් හෝ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව පාඨමාලාවට ඇතුලත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිඳු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

**11. පුහුණු කිරීමේ පරිපාටිය:**

11.1. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු භාෂා මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

11.2. පුහුණු පාසල්වලට ඇතුළත් කරන සිසුන් ඒවායෙ හි බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

11.3. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාග වලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට අනාවරණය වන හෝ සිසුන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කල හැකිය.

11.4. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළදී සිසුන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන VI හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

11.5. පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පාඨමාලාව අත්හැර නොයන බවටත්, පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාල තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, <u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔබගේ පුහුණුව හා අනිවාර්ය සේවා කාලය සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරනු ලබන ඇපකරයට පිළිගත් ඇපකරුවන් දෙදෙනෙකු සහිතව එළඹිය යුතුය.</u> ඉහත 11.3. කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත්වන, පුහුණුව හැරයන, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවන හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදය ඉහත පරිදි අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වන සිසුන් පුහුණුවෙන් / තනතුරෙන් ඉවත්කරන අතර අදාල කාලය තුළදී ඔවුන් වෙත රජය විසින් ගෙවන ලද දීමනා, දරණ ලද වියදම් හා ගිවිසුම්ගත මුදල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාරව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11.6 පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම්කරන අයදුම්කාරියන් අයදුම්පත් එවන දිනය වනවිට අවිවාහක වියයුතු අතර, පුහුණුව ලබන කාල සීමාව තුලදී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

12. සේවයේ නියුක්ත කරවීමේ නියමයන්:

12.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ඇගයීම් වාර්තා ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකරන සිසුන්ගේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාල තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතුය.

12.2. එකී පත්වීම්ලාභීන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

12.3. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් නිවැරදිව ඇතුලත් කල යුතුය. පුහුණුව සඳහා බඳවාගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔවුන්ගේ නම් ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළදී රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාල මුදල අය කර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

12.4. තෝරාගත් අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

12.5. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝග වලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසි වලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

12.6. පාඨමාලා වලට බඳවාගනු ලබන සිසුන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා අදාල තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් ගාස්තු අය කරනු ලැබේ.

12.7 පුහුණු කාලසීමාව තුළදී සිසුන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරතවීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිඳු අයිතිවාසිකමක් නොමැත.

12.8. පාඨමාලාවලට බඳවාගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය හා ජනමාධ්‍යයේ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය .

2026/01/30 වැනි දින
" සුවසිරිපාය ",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.